### යුගයේ ස්වර්ණමය මියැසි රාවය

# කරුණාරත්න දිවුල්ගනේ ගේ තරු එළිය දිගේ



**මහින්ද දිසානායක දිවුල්ගනේ**

ඇසට අසුවන මායාමේ ගීත සමුච්චයෙන් ආරම්භ කල ගීතාවලිය සංහිඳ පාමුල දක්වා විහිද ගියේය. අද තරු එළිය දිගේ ශ්‍රී ලාංකීය පුරාවතේ හදවතට තම ගීතය සමීප කරමින් ආලෝකය ලබා දෙමින් ගීතය හරසුන් ඝෝසාකාරී රැල්ලකට උඩු සුළගට ගසාගෙන යද්දී නෙසැලී තම නිර්මාණ ගුණයේම පිහිටා සිටීම උසස් කලාකරුවකු සතු සුවිශේෂිත වූ ගුණයක්ම මේ ගීතයේ එතෙක් පැවති ගතනු ගතික වූ සම්මතයන් උඩු යටිකුරු කර ගීතය හරවත් අර්ථපූර්ණ රූසපූර්ණ බවින් යුතු එකක් බවට පත් කිරීමට මොහුගේ ගීත කලා මහගු අපකාරයක්ම වේ.

විශේෂයෙන්ම කරුණාරත්න දිවුල්ගනේ නම් මේ මහගු කලාකරුවා ගායනා කළ හැම ගීතයක්ම අර්ථරසයෙන් පෝෂණය වූවා පමණක් නොව සහෘද ශ්‍රී ලාංකික රසික ජනතාව ආදරයෙන් තම හදවතට සමීප කරගත්තේය. මේ විශාල ගීතාවලියෙන් විශේෂිත ගීත රාශියක් ඔවුන්ගේ හදවත මැදින් ඇඳ බැඳ තබා ගැනීමට සමත් වීම අපූර්වත්වයකි. ඔහු සංගීත ක්ෂේත්‍රයට සපැමිණි යුගයේදීම කොතරම් ගීත ප්‍රමාණයක් ආදරය, විරහව ගැන ලියැවෙන්නට ඇත්ද? ඒත් ඇසට අසුවන.... ගීතය නවමු මාර්ගයකට පිවිසෙමින් විරහව පිළිබඳ අළුත් අත්දැකීමක් ලබා දීමට හැකිවිය. විශාරද ගුණදාස කපුගේ වරක් සඳහන් කළේ ඔහු නිර්මාණ්‍ය කළ තනු හා සංගීත නිර්මාණ අතරින් හොඳම ගීත නිම-වුම වන්නේ මේ ගීතය සඳහා කළ සංගීත නිර්මාණය බවයි. යොදා ගත් අළුත් උපමා රූපක, කාව්‍ය භාෂාව, ඉදිරිපත් කළ අත්දැකීම් නැවුම් බව සහෘද ශ්‍රී ලාංකික ප්‍රජාවගේ හදවතේ ආදරයෙන් නිදන් වෙන්න බලපෑ හේතු සාධක විය හැකිය. හොඳ ගීතයක ඇති ස්වාභාවය වන්නේ කාලත්‍රයේදීම නැවුම් බවින් යුතුව රසාස්වාදනය කළ හැකි වීමයි.

නිර්මාණ කරුවන් මොන තරම් ප්‍රමාණයක් තම නිර්මාණ මව් ගුණ වෙනුවෙන් වැය කරන්නට ඇත්ද? මේ ලෝකය නිර්මාණය වී ඇත්තේද සූර්යාගෙන් මෙන්ම මවගෙන බව වරක් එක් දාර්ශනිකයෙක් ප්‍රකාශ කළේද මේ සත්‍ය අවබෝධ කරගත් නිසාය. මේ දක්වා අපේ ගීතාවලියේ මව් ගුණ ගීත කොපමණ ප්‍රමාණයක් ලියවී ඇත්ද? ඒ බොහෝ ගීතවලට වඩා "දිවුල්" අපේ කලාකරුවා ගායනා කරන "ගමට කලින් හිරු" ගීතය අර්ථයෙන් පරිපූර්ණ ද නැවුම් රසයෙන් පිරිපුන්ද යනු අප සක්සුදක්සේ දන්නා කරුණකි. මෙතෙක් එකදු නිර්මාණ කරුවෙක් නොදුටු කෝණයකින් මවකගේ ආදරය දයාව කරුණාව අප වෙනුවෙන් (දරුවන් වෙනුවෙන්) දෙස බැලු දායාද බැල් මේ ගමට කලින් ගීතය පුරා නැවුම් සුවඳ විහිදුවමින් ඉදිරිපත් වී තිබීම විශේෂයකි. මේ ගීතය පමණක් නොව මොහු ගායනා කරන සියළුම මව් ගුණ ගීත අනිකුත් මව් ගුණ ගීතවලින් වෙන්කර හදුනා ගත හැකි සළකුණින් යුතු ගීත වීම විශේෂයකි. "පවස නිවාලු කෑදැති අම්මා" "වෙහෙරක් වාගේ" ආද මව් ගුණ ගීත ඔහු ගායනා කළ දහසක් ගීත අතරින්ද විශේෂත්වයක් ගන්නේ ඒ ගිතවල ඇති සුවඳ විහිදුවන නැවුම් බව නිසාය. බොහේ ගීත රචකයන් මේ වනතෙක් ගීත ලියා ඇත්තේ අම්මා ගෙදර බුදුන් දසමාසයක් කුෂ අප ඇති දැඩිකළ බවයි. එය සැබෑවකි. පුංචි දරුවගේ පටන් දන්නා මවක් ගුණ කියවෙන දෙයකි. එහෙත් නැවුම් අත්දැකීමක් පාඨකයාට ශ්‍රාවකයාට ලබා දෙන්නට හැකි වීම උසස් වූ රසවින්දනාත්මක ගීතය දක්නට ඇති විශේෂිත සාහිත්‍ය වටිනා කමකි. හොඳ සාහිත්‍ය රසක් ඇති උසස් වූ වින්දනාත්මක ගීතයක් ශ්‍රවණය කිරීමෙන් ශ්‍රාවකයෙක් ලබන අත්දැකීම ඔහුගේ ජීවිතයට ආලෝකයකි. "කලා වැවේ නිල් දියවර අපේ අම්මා" මෙතෙක් කිසිදු ගීත රචකයෙක් යොදා නොගත් මෙවන් උපමාවක අම්මා ගැන කියන්න මොන තරම් අපූර්ව බවකින් යුතුද?. කලා වැවේ වතුර කදින් මොනතරම් ප්‍රයෝජන ලබා ගන්නවාද? සාපිපාසා සංසිදුවා ගන්න, ගොවිතැන් කර බඩසාය නිවන්න, පවසට සිසිලක් වන්න මේ ජලය මොනතරම් ප්‍රයෝජනවත්ද? එවන් ප්‍රයෝජනය ලබන ජල කඳ අම්මාද එක හා සමාන ගගුණයෙන් යුක්තය. "රෑ කළුවර ඇවිදින් ඉකිබිඳ හැඬුවත් නෙත නෑ නිදි විඳ ගන්නේ" ඇය දරුවන් වෙනුවෙන් තම ජීවිතයට කැපකොට දියකර තම සැප සම්පත් පයෙහි ලු දුවිල්ලක් මෙන් ඉවත දැමූ හැටි මෙයින් නොකියවේද? අපේ අම්මා උදෑසන නැගිට අපි වෙනුවෙන් කරන කැපවීම "ගමට කලින් හිරු මුළුතැන් ගෙට වඩනා කීමෙන්" මොනවට ප්‍රත්‍යක්ෂ වේ.

පියවරුන් තම දරුවෙක් වෙනුවෙන් කරන මෙහෙය සුළුපටටු නොවුනද, ඔවුන් ගැන ගීත ලියවී ඇති ප්‍රමාණය නම් ඉතා අල්පය. අප්පච්චී කෙනෙකුගේ තම පියාගේ ගුණ සුවඳ ආඝ්‍රහනය කළ කෙනෙකු ලෙස අපේ කලාකරුවා ගැමි සුවඳ මුහුකළ අප්පච්චී ගීතය ගීතාවලිය තුළ සදා සනිටුහන් වේ. මේ සෑම ගැමි පියෙකුගේම ඇති ආත්මය ඔහුගේ දරුවන් වෙනුවෙන් ඇති ආදරණීය වූ ප්‍රාර්ථනා මේ ගීතය තුළ කැටිවී තිබීම ඔහු මේ ගීතය තෝරා ගැනීමට හේතු වූ බව වරක් මා සමඟද ප්‍රකාශ කොට ඇත. එමෙන්ම මේ ගීතයේ සංගීත නිර්මාණය කොට ඇත්තේද අපේම හිතාදර සංගීතඥයෙකු වූ රෝහණ ධර්මකීර්ති වීමද විශේෂයකි. මේ ගීයේ තැනක සඳහන් වෙන්නේ " ස්තකුළු පව් බිඳ ඒ දඬුමං වැද සිදාදියට එන මං තැනුවා" යනුවෙනි. ගැමි පියෙකුගේ දරුවන් වෙනුවෙන් ගොඩනැගුණු අහිංසක සිහිනයද එයම වේ. "දොලේ දියයි, ගහ වැලේ මලයි මට අප්පච්චී" උදේ ඉදලා හවස වෙනතුරු තාත්තලා කරන්නේ පොළොවත් එක්ක ඔට්ටු අල්ලන එක, වතුර ලැබුනේ ගස්වලට මල් ගෙඩි හම්බවුනේ තාත්තගේ (අප්පච්චිගේ) හයිහත්තිය නිසා බව අපි දන්නවා.

ආදරය ගැන ගීත රාශියක්ම භාවිතා කර ඇති නමුත් මේ සෑම ගීතයකම ශ්‍රාවක සිත තදින් ඇද බැඳ තබා ගැනීමට සමත් වී තිබීම විශේෂයකි. ඒ අතරින් "රෝස තොල් සිඹිම්" ගීතය විශේෂ ජනප්‍රියතම හදවත්වල රැඳුණු බැවින් මගේත් ආදරණීය වූ යමුනා මාලිනිය විසින් ලියූ ගීතයකි. " ගජමන් නෝනා" පින්සර ප්‍රේමයේ මන්දහාසින් නෙතට උළෙලක් මේ ජනප්‍රිය තලයේ ඇති ගීත රාශියෙන් ගීත කිහිපයක් පමණි. ඔහුගේ ගීතාවලිය පුරාම දකින්නට ඇත්තේ සහෘද හදවත් වලට සමීප ආදර හා විරහව ගැන ලියවී ඇති ගීතයි. දුවක් ගැනන සිහියට කැඳවා එන පියෙකුගේ නවමු අත්දැකිමක් සිහියට ගෙනෙන ඉතා ජනප්‍රියතම ගීතයයි "මගේ දුවේ ඔබ" ගීතය. දුවක් සමාජයට වටින්නේ ඇය සමාජයක් වෙනුවෙ-න් පෙරලා කරන මෙහෙවර නිසයි. "ලොව දුන්නු දේවල් අද අපිට හෙට ලොවට පෙරලා දිය යුතුයි" රත්න ශ්‍රී, ගීතයේදී මේ කථාව කිවේ ඒකයි. ඒ විතරක් නොව අපේ කලාකරුවා ගායනා කරන සෑම ගීතයක්ම සුගායනීය මධුර වූ හඬකින් සේම ඔහුගේම අනන්‍යතා හඬකින් ගැයීමද ගී පද රචනය සංගීතයට අමතරව ගීතය තුළ සුවිශේෂිත ඇගැයීමක් වේ.

ගීතයේ යෞවනය මධුර වූ සුගායනීය වූ සොඳුරු ගී මියැසිය "තරු එළිය දිගේ" ඔබේත් මගේත් ආදරණීය ප්‍රවීන ගායන ශිල්පි කරුණාරත්න දිවුල්ගනේ ඉදිරිපත් කරයි. රෝහන ධර්මකීර්ති නිහාල් කලුබෝවිල චතුර පෙරේරා ඩී.ඩී. ගුණසේන ඉන්ද්‍රජිත් මිරිහාන කැමරන් කොළඹගේ සමඟ තරංගා වාදක මණ්ඩලය සහභාගිවන තරු එළිය දිගේ ජූනි මස 08 වෙනි සෙනසුරාදා සවස 4.00ට බේසන් සෙන්ටර්හිදී (මෙල්බ(ර්)න්) හිදී පැවැත්වෙයි සියළුම ශ්‍රී ලාංකික වෙළඳසැල් වලින් ප්‍රවේශපත්‍ර දැන් මිලදී ගත හැකියි. ඔබේ ප්‍රවේශ පත්‍රය කල් වේලා ඇතිව දැන්ම වෙන්කර ගන්න උසස් රස වින්දනයක් සඳහාම.

විමසීම් මහින්ද- 0425 808642 චන්දන - 0430 390354 මානෙල් - 0428 342541

## අපායේ විසල් ආකෘතියක් බෙරික්හි ශාඛ්‍යමුණි විහාරයේ

අවුරුදු අසිරි ගෙවී යත්ම වෙසක් මහා පුන්‍යෝත්සවයට සූදානම් වීම අප කුඩා කල සිරිත විය. එය අදටත් අඩු වැඩි වශයෙන් මව් බිමේ දක්නට ලැබෙයි. මෙරටට සංක්‍රමණය වී සිටින ශ්‍රී ලාංකික බොදුනුවන් මතු නොව අන්‍ය සම්භවයක් ඇති බොදුනුවන් ද වෙසක් උත්සවය සැමරීම සඳහා ලහි ලහියේ සූදානම් වන සමයකි මේ. මූලික වශයෙන් ප්‍රතිපත්ති පූජාවන් හා ආමිස පූජාවන් ලෙසින් දෙයාකාරයකට කෙරෙනා මෙම පුණ්‍ය කටයුතු වසරින් වසර වැඩි දියුණු වන ප්‍රවණතාවක් දක්නට ලැබීම සතුටට කාරණයක් නොවේද? වෙසෙ-සින්ම ආමිස පූජාවන් සඳහා උනන්දුවන සැදැහැතියෝ වසරින් වසර මෙරටට නැවුම් දේ එක් කිරීමට ද උනන්දු වෙති.

මව් බිමට නැවුම් දෙයක් නොවුවද මෙල්බර්න් නුවරුන්ට අළුත් අත්දැකීමක් එක් කරමිනි වෙසක් නිර්මාණයක් කිරීමට බෙරික් හි ශාඛ්‍යමුණි විහාරස්ථානයේ දායක පිරිස සූදානම් වෙති. ඒ අපායේ ආකෘතියක් නිමැවීමයි. මේ ඉදිකිරීම්වල නියැලී සිටින පිරිසෙන් අයෙකු සම්බන්ධ කරගෙන ඒ පිළිබඳව විමසීමට අපි යුහුසුළු වූයෙමු. ඒ අතර ක්‍රියාකාරීව කටයුතු කරන නයන කුමාරසිංහ මහත්මාව අප හට හඳුන්වා දෙන ලද්දේ ලක්ෂ්මන් ගමගේ සහෘදයාය.

"අපේ අපාය ආකෘතියේ විශේෂත්වය වෙන්නේ ඒකේ විශාලත්වයයි, එහි ඇතුලත් වන දේය. දිගින් මේ නිර්මාණය මීටර් හැට දෙකක් වෙනවා." නයන අප හට නිර්මාණය පිළිබඳව කරුණු දැක්වීමට ඉදිරිපත් වුණා.

"ලෝ දිය හැලියේ දැමීම", "කටු ඉඹල", "ගිනි සිසිල", "උල තැබීම", වාගේ අපායේ දඬුවම් විධි සියල්ලක්ම මේ නිර්මාණයට ඇතුලත් කළා. ඒවාට යමපල්ලන්ගේ ක්‍රියාවන් එහෙමත් ඇතුලත්. ඉතින් නියම මිනිසෙකුගේ උසේ ප්‍රමාණයට රූප සීයක් නිර්මානය වෙනවා, මේ දේවල් නිරූපණය කරන්න.
මේ හැමදෙයක්ම ක්‍රියාත්ම වෙන්නේ යන්ත්‍රානුසාරයෙන්.

"ඇත්තටම මේ වනතෙක් මෙහේ කරපු විශාලම වෙසක් සැරසිල්ල මේ නිර්මාණය කියලා කියන්න පුළුවන්."

රැකියාවන් හා දූ දරුවන්ගේ කටයුතු නිසාවෙන් කාර්ය බහුලව සිටිනා අතර මෙවන් විශාල නිර්මාණයක් ඉදිකිරීම සඳහා ශ්‍රමය හා කාලය සොයාගන්නේ කෙලසකින් ද?

"අපි දැන් මාසයක විතර ඉඳලා මේ කටයුතුවල යෙදිලයි ඉන්නේ. සතියේ දවස් හතේම හවස පහමාරේ ඉඳන් රෑ දොළහ විතර වෙනකල් අපි මේ වෙනුවෙන් වෙන් කරලයි තියෙන්නේ. සාමාන්‍යයෙන් අපි විසි දෙනෙක් විතර මේ වෙනුවෙන් එකතු වෙනවා. හැමෝම එකෙකු වගේ කැපවෙලා මහන්සි වෙනවා. ඇත්තෙන්ම, නම් වශයෙන් නොකිව්වත් අපි ස්තුතිවන්ත වෙන්න ඕන ඒ අයට."

"අපි මතක් කරන්න ඕන ශාඛ්‍යමුණි විහාරස්ථානයේ වැඩ වසන ස්වාමීන් වහන්සේලාටත්, ගරු දිගා මඩුල්ලේ විමලානන්ද නායක ස්වාමීන් වහන්සේගේ අනුශාසනාවන්ට අනුව අලවතුපිටියේ සන්තිච්ච ස්වාමීන් වහන්සේත්, දිද්දෙණිනෙත සුමේධ ස්වමීන් වහන්සේත් අපට මේ කටයුත්තට හුඟක් උපකාර කරනවා."

මෙම සාකච්ඡාව වන විට රාත්‍රී එකොළහ හමාර පමණ වී තිබිණ. ඒ වන විටත් පිරිස සමඟ වෙහෙසෙමින් සිටි සංතිච්ච හිමියන් සමගින් ද වචනයක් කතා කිරීමට අපි උන්නදු වූයෙමු.

"බුද්ධ දේශනාවට අනුව අපායේ සියළුම ක්‍රියාකාරීත්වයන් මෙම නිර්මාණයෙන් ප්‍රදර්ශනය කෙරෙනවා. ඇත්තටම කුඩා දරුවන්ට එහෙම වටිවී මේ නිර්මාණය. විශේෂයෙන්ම මෙහි ඉපදුණ ළමයින්ට. ඒ විතරක් නෙවෙයි ලොකු අයටත් වටිනවා.

"ඒ වගේම මේ වාරයේ අපේ පන්සලේ ධාතු ප්‍රදර්ශනයක් පැවැත්වෙනවා. රහතන් වහන්සේලා දහ නමකගේ සර්වඥ කේෂ ධාතූන් වහන්සේලා මේ සඳහා වඩමවනවා. ලංකාවේදී වුණත් දැක බලාගන්න, වැඳ පුදාගන්න අපහසුයි, මේ තරම් ධාතූන් වහන්සේලා ප්‍රමාණයක්. මේ ධාතූන් වහන්සේලා අතර අග්‍ර ශ්‍රාවකයන් වුණ සැරියුත්, මුගලන් රහතුන් වහන්සේලාගේත්, මිහිදු මහ රහතන් වහන්සේගේත්, රේවත රහතන් වහන්සේගේත් ධාතූන් වහන්සේලා ඇතුලත් වෙනවා.

"මීට අමතරව කොසොල් රජතුමා දැකපු සිහින 16 දහම් පාසැල් දරුවන් අතින් නිර්මාණය වෙනවා. ඒ වගේම සුපුරුදු පරිදි වෙසක් පහන් කූඩුත් හදනවා."

බෙරික්හි ශාඛ්‍යමුණි විහාරය වෙසක් ආමිස පූජාවන්ට සූදානම් වන අඅන්දමයි ඒ. සංතිච්ච ස්වාමීන් වහන්සේට කෘතවේදී වූ අප නයන වෙත යොමුවූයේ අපාය නිර්මාණය ප්‍රදර්ශනය කෙරෙනා දින පිළිබඳව දැන ගැනීම සඳහායි.

අපි මේ නිර්මාණය මැයි මාසයේ 25, 26 දිනවලදීත් ජූනි මස පළවෙනිදාත්, දෙවෙනිදාත් ප්‍රදර්ශනය කිරීමට සූදානම් කරනවා. නයන නැවතත් සිය පිරිස අතරට එක්විය. අපි ඔහුටත් ස්තුතිවන්ත වූයෙමු. ඒ ශ්‍රී ලාංකික සම්භවයක් ඇති අප මතු මතු නොව සියළු බොදු දනන් වෙනුවෙන් කෙරෙනා නිර්මාණයක් සඳහා කැපව සිටිනා සියළුම දෙනා වෙනුවෙන් කළ ස්තුතියකි, පුණ්‍යානුමෝදනාවකි.

**සිසිර දිසානායක**